EDB SRI LANKA

# අපනයන පුවත්

මාසික තොරතුරු ප්‍රකාශනය

01 වෙළුම 03 කලාපය
2023 අගෝස්තු/සැප්තැම්බර්




අපනයන සංවර්ධන මණ්ඩලයේ 44වන සැමරුම 03

ජාතික ඇසුරුම් මධ්‍යස්ථානය විවෘත කිරීම 04

කාබනික කෘෂිකාර්මික ඩිජිටල් පද්ධතියක හදුන්වා දීම 06

අපනයන ක්‍රියාදාමය ගැන ඉගෙන ගන්න හොඳම මග 07






ප්‍රකාශනය :

අපනයන පුවත් - මාසික තොරතුරු ප්‍රකාශනය ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ ප්‍රකාශනයකි

මගපෙන්වීම :

ආචාර්ය කිංස්ලි බර්නාඩ්
මාලනී බද්දේගමගේ
අචිනි වීරවර්ධන

සංස්කාරක මණ්ඩලය :

උපුල් ගලප්පත්ති
නාලක මධුෂාන්
චන්දිම වන්නිආරච්චි
කේ.ඩී.දර්ශන

පිටු සැකසුම :

චන්දිම දොළපිහිල්ල

බෙදාහැරීම :


වෙළඳ පහසුකම් සහ වෙළඳ තොරතුරු අංශය

0112 300 724









## ලොව ජයගන්න හැටි දැනගන්න

ශ්‍රී ලංකාව පෙර නොවූ විරූ අභියෝග රැසකට පසුගිය සමයේ මුහුණ දුන්නේය. මේ වන විට අප ඒ අති දුෂ්කර කාල සීමාව පසුකර බලාපොරොත්තු තැබිය හැකි අනාගතයකට ප්‍රවේශ වෙමින් සිටින්නෙමු.

එහිදී රටේ ආර්ථිකය නැංවීමේ පළමු අභියෝගය රටට වැඩි වැඩියෙන් විදේශ විනිමය ගෙන ඒම බව අමුතුවෙන් කිව යුතු නොවන්නේය. එහිදී වැඩිම කාර්ය භාරයක් පැවරෙන්නේ අපනයන ක්ෂේත්‍රය වෙතටය. ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ කාර්ය භාරය වී ඇත්තේ ඒ සඳහා සක්‍රියව මැදිහත් වීමය.

රටේ විදේශ විනිමය සංචිත ඉහළ නැංවීමට නම් දැනට සිදුකෙරෙන මෙරට අපනයන නිෂ්පාදන ධාරිතාවය ඉහළ නැංවීමට අතිරේකව නව අපනයන කරුවන් ජනිත කිරීම හරහා වැඩි අපනයන ඉලක්කයක් සපුරා ගැනීම ප්‍රධාන අවශ්‍යතාවක් වන්නේය.

අපනයන තත්වයට ගෙන යා හැකි ව්‍යවසායකයින් රැසක් මෙරට පුරා විසිරී ඇති බව ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය මේ වන විටත් හඳුනාගෙන ඇත්තේය. ඔවුන්ගේ නිෂ්පාදන වල ගුණාත්මක බව, තත්වය, ඇසුරුම්කරණය ඉහළ නැංවීම මගින් මෙන්ම ජාත්‍යන්තර වෙළඳ පොළට පිවිසීමේදී දැනුවත් විය යුතු කරුණු, නව වෙළඳ පොළවල් හඳුන්වා දීම මෙන්ම, නිෂ්පාදන අගය වැඩිකිරීමේ ක්‍රමවේද පිළිබඳවද ව්‍යවසායකයින් දැනුවත් කිරීම මෙහිදී කළ යුතුම දෙයක්ය.

අපනයන පුවත් මාසික තොරතුරු ප්‍රකාශනය හරහා අප උත්සාහ කරන්නේ එම අරමුණු සාක්ෂාත් කර ගැනීමය.

සංස්කාරක මණ්ඩලය

# ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය සිය 44වන සංවත්සරය සමරයි






ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය (EDB) එහි 44 වැනි සංවත්සරය නිමිත්තෙන් සංවිධානය කළ සමරු උත්සවය සභාපති ආචාර්ය කිංස්ලි බර්නාඩ් මහතාගේ ප්‍රධානත්වයෙන් අගෝස්තු 2 වැනි දින කොළඹ ප්‍රධාන කාර්යාල පරිශ්‍රයේදී පවත්වන ලදී.

ආචාර්ය කිංස්ලි බර්නාඩ් මහතා උත්සවයට එක්වෙමින් කියා සිටියේ අපනයන සංවර්ධනය හා ප්‍රවර්ධනය සඳහා අපනයන සංවර්ධන මණ්ඩලය සුවිසල් කාර්යභාර්යයක් සිදුකර ඇති බවත් අද වනවිට එය පුළුල් වී ඇති බවත්ය" ඉදිරි අභියෝග හදුනාගනිමින් ඒ සඳහා ශක්තිමත්ව මුහුණදියයුතු බව සභාපතිවරයා කාර්යමණ්ඩලය හමුවේ වැඩිදුරටත් ප්‍රකාශ කරන ලදි.

පසුගිය දශක හතර තුළ ජාත්‍යන්තර වෙළඳ ප්‍රදර්ශන, වෙළඳ නියෝජිත සාකච්ඡා, මූල්‍ය සහන යෝජනා ක්‍රම, ව්‍යාපාරික බුද්ධිය ලබා දීම යනාදිය හරහා අපනයනකරුවන් දහස් ගණනකට ජාත්‍යන්තර වෙළඳපොලේ තම පැවැත්ම තහවුරු කර ගැනීමට අපනයන සංවර්ධන මණ්ඩලය සහාය ලබා දී ඇත. සුළු පරිමාණ ව්‍යවසායකයන් ලෙස එදා අපනයන සංවර්ධන මන්ඩලය සමඟ කටයුතු කළ බොහෝ ව්‍යවසායකයන් අද අපනයන ක්ෂේත්‍රයේ දැවැන්තයන් ලෙස ජාතික ආර්ථිකයට විශාල දායකත්වයක් ලබාදෙයි.

උත්සවය අමතමින් අපනයන සංවර්ධන මණ්ඩලයේ වැඩබලන අධ්‍යක්ෂ ජනරාල් මාලනී බද්දේගමගේ මහත්මිය විසින් 1979 වර්ෂයේද සිට අපනයන ප්‍රවර්ධන නියෝජිතායතනය පිහිටුවීමේ සිට සිදු කරන ලද සේවාව විස්තර කළ අතර **EXPO** 92 සහ **EXPO** 94 පැවැත්වීම වැනි සුවිශේෂී ජයග්‍රහණ ඉස්මතු කළාය. ලංකා කුරුඳු සඳහා **GI** සහතිකය ලබා ගැනීමණී ජාතික කාබනික පාලන ඒකකය පිහිටුවීම, මෙන්ම අපනයන සන්නාමකරණ සදහා මුලපිරීම් පිළිබදව ඇය වැඩිදුරටත් සදහන් කරන ලදි.



## දේශීය නිෂ්පාදන කර්මාන්තයේ අභිවෘද්ධිය උදෙසා

# ජාතික ඇසුරුම් මධ්‍යස්ථානය සක්‍රීය කෙරෙයි



දේශීය ඇසුරුම් නිෂ්පාදන කර්මාන්තය ප්‍රවර්ධනය කිරීමේ අවශ්‍යතාවයට පිළියම් යෙදීම සඳහා ජාතික ඇසුරුම් මධ්‍යස්ථානය අපනයන සංවර්ධන මණ්ඩලය තුල ස්ථිරව ස්ථාපිත කිරීම සිදුවිය. ඒ යටතේ ස්ථිර ඇසුරුම් ප්‍රදර්ශන ඒකකය විවෘත කිරීම ජනාධිපති ජ්‍යෙෂ්ඨ අතිරේක ලේකම් ඒ. ආර්. දේශප්‍රිය මහතා, කර්මාන්ත අමාත්‍යාංශයේ ලේකම් තිලකා ජයසුන්දර මහත්මිය, ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ සභාපති ආචාර්ය කිංස්ලි බර්නාඩ් මහතා, කර්මාන්ත අමාත්‍යාංශයේ අතිරේක ලේකම් චමින්ද පතිරාජ මහතා, වැඩබලන අධ්‍යක්ෂ ජනරාල් මාලිනී බද්දේගම මහත්මිය, ජාතික ඇසුරුම් මධ්‍යස්ථානයේ සහ අපනයන සංවර්ධන මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩලය ඇතුළු නිලධාරීන් පිරිසකගේ සහභාගීත්වයෙන් 2023 අගෝස්තු මස 15 වන දින ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය පරිශ්‍රයේදී සිදුවිය.

ගරු ජනාධිපතිතුමන්ගේ සංකල්පයක් යටතේ, දේශීය ඇසුරුම් නිෂ්පාදන මගින් අපනයන භාණ්ඩ සඳහා අගය එකතු කිරීම සහ පසු අස්වනු හානි අවම කිරීම සඳහා ඇසුරුම්කරණය ප්‍රමුඛතාවයක් ලෙස හඳුනාගෙන ජාතික ඇසුරුම් මධ්‍යස්ථානය තුළ ස්ථිර ඇසුරුම් ප්‍රදර්ශන ඒකකයක් අපනයන සංවර්ධන මණ්ඩලය පරිශ්‍රයේ පිහිටුවීමට රජය තීරණය කරන ලදි. ශ්‍රී ලංකා රජය එහි අතුරු අයවැය 2022 (අයවැය යෝජනා අංක 32) යටතේ අපනයන සංවර්ධන මණ්ඩලයෙහි, ජාතික ඇසුරුම් මධ්‍යස්ථානයේ ප්‍රවර්ධනය සහ සංවර්ධනය උදෙසා ජාත්‍යන්තර වෙළඳපොළට සරිලන සේ දේශීය ඇසුරුම්කරණ අමුද්‍රව්‍ය සංවර්ධනය කිරීම සඳහා ඇසුරුම්කරණ සැලසුම් නැවත සක්‍රීය කළ යුතු බව හඳුනාගෙන ඇත. දේශීය ඇසුරුම්කරණ විසඳුම් උපයෝගී කර ගනිමින් අපනයන නිෂ්පාදනවල වටිනාකම ඉහළ නැංවීම සහ පසු අස්වනු පාඩු අවම කිරීම මෙහි අරමුණය.

රාජ්‍ය සහ පෞද්ගලික අංශයේ පාර්ශ්වකරුවන් අතර උපායමාර්ගික සහයෝගීතාවයක් ඇති කර ගැනීමේ මෙම ජාතික මැදිහත්වීම ශ්‍රී ලංකාවේ ඇසුරුම් කර්මාන්තය දියුණු කිරීම සහ ප්‍රවර්ධනය කිරීම සඳහා සහාය වනු ඇත. ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශය (Ministry of Investment Promotion), කර්මාන්ත අමාත්‍යාංශය (Ministry of Industries), ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය (Sri Lanka Standards Institution-SLSI) ජාතික ඉංජිනේරු පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය (National Engineering Research and Development Centre) ලංකා කොරිගේටඩ් පුද්ගලික සමාගම (Lanka Corrugated Carton Manufactures Association) ශ්‍රී ලංකා ඇසුරුම් ආයතනය (Sri Lanka Institute of Packaging) කාර්මික තාක්ෂණ ආයතනය (Industrial Technology Institute) ජාතික ශිල්ප සභාව (National Craft Council) මොරටුව විශ්වවිද්‍යාලය (University of Moratuwa) පසු අස්වනු කළමනාකරණ ජාතික ආයතනය (National Institute of Post-Harvest Management) ජාතික මෝස්තර මධ්‍යස්ථානය (National Design Centre) කාර්මික සංවර්ධන මණ්ඩලය (Industrial Development Board) ශ්‍රී ලංකා නැනෝ තාක්ෂණ ආයතනය (Sri Lanka Institute of Nanotechnology) තල් සංවර්ධන මණ්ඩලය (Palmyra Development Board) සහ ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය (Export Development Board) ජාතික ඇසුරුම් මධ්‍යස්ථානය (National Packaging Centre) තුළ සහයෝගයෙන් කටයුතු කරයි.

අපනයනකරුවන්, ඇසුරුම් කර්මාන්තයේ නියැලෙන්නන්, නිෂ්පාදකයින්, නිර්මාණකරුවන්, විභවව්‍යවසායකයින්, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්, කාන්තා ව්‍යවසායකයින්, මේ ආශ්‍රිත වෙනත් රාජ්‍ය ආයතන, විශ්වවිද්‍යාල සහ පාසල් ශිෂ්‍යයන්, පර්යේෂණ සහ සංවර්ධන ආයතන, සැපයුම් සේවා සපයන්නන් යන සියලුම පාර්ශ්වකරුවන්ගේ ප්‍රයෝජනය උදෙසා ඇසුරුම්කරණ සංවර්ධන විෂයට අදාළ ව්‍යාපෘති සඳහා ජාතික කේන්ද්‍රස්ථානය ලෙස, ජාතික ඇසුරුම් මධ්‍යස්ථානය (NPC) ක්‍රියා කරයි.

ජාතික ඇසුරුම් මධ්‍යස්ථානය මඟින් ලබාදෙන සේවාවන් පිළිබඳ වැඩිදුර තොරතුරු දැන ගැනීම සඳහා පහත දුරකථන අංක සහ ඊමේල් ලිපිනය භාවිත කළ හැකිය.

011 2303975, 071 8246762
ඉන්දික සුගතදාස මහතා
සහකාර අධ්‍යක්ෂ
ජාතික ඇසුරුම් මධ්‍යස්ථානය

077 7215911
හෙල්මලී විතාරණ
සහකාර අධ්‍යක්ෂ
ජාතික ඇසුරුම් මධ්‍යස්ථානය

විද්‍යුත් ලිපිනය npc@edb'gov'lk





# කාබනික කෘෂිකාර්මික ලියාපදිංචිය සහ අධීක්ෂණය සඳහා ඩිජිටල් පද්ධතියක් හඳුන්වා දෙයි




කාබනික කෘෂිකාර්මික නවීකරණය කිරීමේ පියවරක් ලෙස ජාතික කාබනික පාලන ඒකකය විසින් (NOCU) ඩිජිටල්කරණය වූ ලියාපදිංචි සහ අධීක්ෂණ පද්ධතියක් එළිදක්වා ඇත. එමගින් කාබනික කෘෂිකාර්මික පාර්ශවකරුවන් සඳහා ලියාපදිංචි සහ සහතික කිරීමේ ක්‍රියාවලීන්හි විප්ලවීය වෙනසක් සිදුවන අතර සමස්ත කාබනික සැපයුම් දාමය හරහා ඉහළ කාර්යක්ෂමතාවයක් සහ තිරසාර බවක් ඇති කරයි.

ජනාධිපති ලේකම් කාර්යාලයේ සහයෝගීතාවයෙන් ජාත්‍යන්තර වෙළඳ මධ්‍යස්ථානය (ITC) සහ ජාත්‍යන්තර සහයෝගීතාවය සඳහා ජර්මානු සංස්ථාව (GIZ) එක්ව සංවිධානය කරන ලද උත්සවයකදී අතිගරු ජනාධිපති රනිල් වික්‍රමසිංහ මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් පසුගියදා ඩිජිටල්කරණය වූ ලියාපදිංචි සහ අධීක්ෂණ පද්ධතිය එළිදක්වි.

1979 අංක 40 දරන අපනයන සංවර්ධන පනතේ දක්වා ඇති රෙගුලාසිවලට අනුකූලව ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ (EDB) යටතේ ක්‍රියාත්මක වන ජාතික කාබනික පාලන ඒකකය විසින් කාබනික කෘෂිකර්මාන්තයට අදාල ක්‍රියාකාරකම්වල සියලුම අංශ අධීක්ෂණය හා නියාමනය කිරීමේ ප්‍රධාන කාර්යභාරය සිදුකරනු ඇත. ඒ යටතේ වගා කිරීම, සහතික කිරීමණී සැකසීමණී අලෙවිය මෙන්ම කාබනික නිෂ්පාදන ආනයනය සහ අපනයනය වැනි විවිධ ක්ෂේත්‍ර ඇතුළත් වේ.

ජාතික කාබනික පාලන ඒකකයේ (NOCU) ප්‍රධාන අරමුණ වන්නේ ශ්‍රී ලංකාවේ කාබනික නිෂ්පාදනවල අව්‍යාජභාවය පිළිබඳ දේශීය හා ජාත්‍යන්තර වෙළඳපලවල විශ්වාසය වැඩි දියුණු කිරීමයි. ඒ යටතේ හඳුන්වාදුන් ඩිජිටල් පද්ධතිය මඟින් රට තුළ සිටින සියලුම කාබනික පාර්ශවකරුවන් බාධාවකින් තොරව ලියාපදිංචිය සහ අධීක්ෂණය සඳහා ඒකාබද්ධ මාර්ගගත පද්ධතියක් නිර්මාණය කර ඇත.

අලුතින් හඳුන්වා දුන් ඩිජිටල් පද්ධතිය මඟින් සැලසුම් කර ඇත්තේ විවිධ පරිශීලක කාණ්ඩායම් වන සහතික ආයතන, අපනයනකරුවන, ආනයනකරුවන්, ගොවීන්, ගොවි සංගම්, සැකසුම්කරුවන් සහ රසායනාගාර නිලධාරීන්ගේ අවශ්‍යතා සම්පූර්ණ කිරීමයි.



## අපනයන ක්‍රියාදාමය ගැන

# විධිමත්ව ඉගෙන ගන්න හොඳම මග



අපනයනය යනු සංකීර්ණ ක්‍රියාදාමයකි. අපනයන ක්‍රියාවලියේ නිරත වන ඔබත්, විදේශ ගැනුම් කරුවාත් අතර වන වෙළඳාමේදී ඊට සම්බන්ධ වන පාර්ශවයන් ගණනාවක්ද වේ. එමෙන්ම සපුරාලිය යුතු නෛතික හා අවශ්‍යතා රාශියක්ද තිබේ.

ඒ පිළිබඳ විධිමත් දැනුමක් ලබා ගත හැකි ප්‍රමුඛතම පාඨමාලා දෙකක් ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය විසින් පවත්වනු ලබයි. ඉන් එක් පාඨමාලාවක් වන්නෙ, ආනයන අපනයන ක්‍රියා පරිපාටිය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව වන අතර අනෙක් පාඨමාලාව වනුයේ ජාත්‍යන්තර වෙළඳාමේ මෙහෙයුම් ක්‍රියාවලිය පිළිබඳ අධ්‍යයනයය.

ආනයන අපනයන ක්‍රියා පරිපාටිය පිළිබඳ පාඨමාලාව සකසා ඇත්තේ භාණ්ඩ නිෂ්කාශනය, භාණ්ඩ ප්‍රවාහනය සහ නැව්ගත කිරීම් පිළිබඳ උනන්දුවක් දක්වන අයවලුන් සඳහා වේ. තවද, ආනයන, අපනයන ක්‍රියාදාමය පිළිබඳ මූලික දැනුවත් භාවයක් ලබාගැනීමට අපේක්ෂා කරන අය මෙන්ම ක්ෂේත්‍රය පිළිබඳ උනන්දු වන සැමටත් මෙය ඉතා වැදගත් වනු ඇත.

එහි පාඨමාලා අන්තර්ගතය ලෙස, අපනයන ක්‍රියා පරිපාටිය හඳුන්වා දීම, ආනයන ක්‍රියා පරිපාටිය හඳුන්වා දීම, රේගු කටයුතුද, බැංකුකර පිළිබඳවද, වරාය හා ගුවන් භාණ්ඩ හැසිරවීම් පිළිබඳ, ආයෝජන මණ්ඩලයේ ක්‍රියාදාමය, ජාත්‍යන්තර වෙළඳාමට අදාළ බැංකු කටයුතු සිදු කරන ආකාරය, භාණ්ඩ ප්‍රවාහනය, අපනයනයේදී හා ආනයනයේදී තත්ව පාලන කටයුතු, භාණ්ඩ රක්ෂණය මෙන්ම ජාත්‍යන්තර වෙළඳාමේ වෙනත් අවශ්‍යතාද ඇතුළත් වේ. මෙම පාඨමාලාවන්හි දේශන සිදු කරනු ලබන්නේ රාජ්‍ය හා පෞද්ගලික ආයතන වල සේවයේ නියුතු ප්‍රවීණයන් විසිනි.

ජාත්‍යන්තර වෙළඳාමේ මෙහෙයුම් ක්‍රියාවලිය පිළිබඳ පාඨමාලාව වඩාත් සුදුසු වන්නේ ජාත්‍යන්තර වෙළඳ කටයුතු වල නිරත වන්නන් සහ ඒ සඳහා යොමු වීමට අපේක්ෂා කරන්නන් හටය. තවද ජාත්‍යන්තර වෙළඳාමට සම්බන්ධ රාජ්‍ය හා පෞද්ගලික ආයතන වල ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ට මෙන්ම විධායක මට්ටමේ නිලධාරීන්ටද මෙය එකසේ ප්‍රයෝජනවත් පාඨමාලාවකි.

මෙම පාඨමාලාවේ පළමු මොඩියුලය යටතේ, ප්‍රවාහන හා කාර්ය උපාය සේවා (ලොජිස්ටික්) සහ ආනයන අපනයන ක්‍රියා පරිපාටිය, භාණ්ඩ ප්‍රවාහනය, රේගු පරිපාටිය, වරාය හා ගුවන් තොටුපළ ක්‍රියාදාමය, ආනයනික යෙදවුම් පිළිබඳ වන තීරුබදු ප්‍රවේශයන, ඇසුරුම්කරණය, සමුද්‍ර රක්ෂණය, ආයෝජන මණ්ඩලයේ ක්‍රියාදාමය යන අංශ යටතේ දැනුවත් කෙරේ. දෙවැනි මොඩියුලය යටතේ, ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ කාර්ය භාරය, ජාත්‍යන්තර වෙළඳාමේ නෛතික හා මූල්‍යමය අරමුණු, සාකච්ඡා කුසලතා වර්ධනය, විකිණුම් සබඳතා දියුණු කිරීම, ප්‍රවාහන කොන්ත්‍රාත්තු, ගෙවීම් පියවීමේ ක්‍රමයන්, භූවමාරු අවදානම, ආරවුල් විසඳීම, වරාය වෙළඳාම, ඊ වාණිජ්‍යය ඇතුළු විෂයය ක්ෂේත්‍ර ඇතුළත් වේ. මීට අමතරව, ඉහත පාඨමාලා දෙක සඳහාම ශ්‍රී ලංකා රේගුව, කොළඹ වරායේ නැව්බඩු මෙහෙයුම් සහ කටුනායක ගුවන් තොටුපළේ ගුවන් භාණ්ඩ මෙහෙයුම් පිළිබඳ ක්ෂේත්‍ර චාරිකාවක්ද ඇතුළත් වේ.

මෙම පාඨමාලාවන් පිළිබඳ උනන්දුවක් දක්වන ඔබට ඒ පිළිබඳ වැඩි විස්තර ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ www.srilankabusiness.com වෙබ් අඩවියට පිවිසීමෙන් ලබා ගත හැක. එමෙන්ම වෙළඳ පහසුකම් හා වෙළඳ තොරතුරු අංශයේ සහකාර අධ්‍යක්ෂිකා, හෙල්මලී විතාරණ මහත්මිය හෝ අපනයන ප්‍රවර්ධන නිලධාරිනී, චතුරි පද්මපෙරුම මෙනවිය ඇමතීමෙන් වැඩිදුර තොරතුරු ලබා ගත හැකිවේ.

ඒ සඳහා දුරකථන අංක 0112 300 705 / 11 අමතා අදාල පාඨමාලාවට අදාල ඉහත නම් සඳහන් නිලධාරිනියන් සම්බන්ධ කරගත හැකියි.

# 2023 ජූලි මාසයේ ශ්‍රී ලංකාවේ අපනයන කාර්ය සාධනය



**ශ්‍රී ලංකාවේ වෙළඳ භාණ්ඩ අපනයනය 2023 ජූලි මාසයේදී ඩොලර් බිලියනයක සීමාව ඉක්මවයි**

## 2023 ජූලි මාසයේ ශ්‍රී ලංකාවේ අපනයන කාර්ය සාධනය


ශ්‍රී ලංකා රේගුව විසින් නිකුත් කරන ලද තාවකාලික දත්තවලට අනුව, 2023 ජුනි මාසයට සාපේක්ෂව ශ්‍රී ලංකාවේ වෙළඳ භාණ්ඩ අපනයනය 2023 ජූලි මාසයේ දී ඇමරිකානු ඩොලර් මිලියන 1,027.2 දක්වා 2.18% කින් වැඩි විය. කෙසේ වෙතත්, එය 2022 ජූලි මාසයේ වාර්තා වූ අගයට සාපේක්ෂව 11.79% ක අඩුවීමකි.

අපනයන නිෂ්පාදන සඳහා විශේෂයෙන් ඇඟලුම් සහ රෙදිපිළි, රබර් සහ රබර් ආශ්‍රිත නිෂ්පාදන සහ පොල් සහ පොල් ආශ්‍රිත නිෂ්පාදන සඳහා ඇති ඉල්ලුම අඩුවීම හේතුවෙන් වෙළඳ භාණ්ඩ අපනයන පහත වැටීම සිදුවේ.

**සේවා අපනයනය**

2023 ජනවාරි සිට ජූලි දක්වා කාලය සඳහා සේවා අපනයනවල ඇස්තමේන්තුගත වටිනාකම ඇමෙරිකානු ඩොලර් මිලියන 1,228.17ක් වූ අතර එය 2022 අනුරූප කාලපරිච්ඡේදයට වඩා 17.32% කින් වැඩි විය. අපනයන සංවර්ධන මණ්ඩලය විසින් ඇස්තමේන්තු කර ඇති සේවා අපනයන තොරතුරු තාක්ෂණය/ ව්‍යාපාර ක්‍රියාවලි කළමනාකරණ (ICT/BPM), ඉදිකිරීම්, මූල්‍ය සේවා, ප්‍රවාහන සහ සැපයුම්වලින් සමන්විත වේ.

රූපය 1: මාසික වෙළඳ භාණ්ඩ අපනයන කාර්ය සාධනය 2020 - ජූලි, 2023




(මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහබැංකුව, ශ්‍රී ලංකා රේගුව)

## 2023 ජූලි මාසයේ ප්‍රධාන අපනයන

### වගුව 1: නිෂ්පාදන අනුව වෙළඳ භාණ්ඩ අපනයන කාර්ය සාධනය සංසන්දනය කිරීම (ඇ.ඩො.මි)

| අපනයන භාණ්ඩ | ජන-ජූලි 2022 | ජන-ජූලි 2023 | % වර්ධනය (22-23) | ජූලි 2022 | ජූලි 2023 | % වර්ධනය (22-23) |
|---|---|---|---|---|---|---|
| ඇඟලුම් සහ රෙදිපිළි | 3,517.44 | 2,880.61 | -18.10 | 550.05 | 427.48 | -22.28 |
| තේ | 694.90 | 750.72 | 8.03 | 117.52 | 115.20 | -1.97 |
| රබර් ආශ්‍රිත නිෂ්පාදන | 605.85 | 529.08 | -12.67 | 89.24 | 79.31 | -11.13 |
| පොල් ආශ්‍රිත නිෂ්පාදන | 501.47 | 402.80 | -19.68 | 67.15 | 63.34 | -5.67 |
| දියමන්ති, මැණික් සහ ස්වර්ණාභරණ | 192.28 | 228.93 | 19.06 | 36.39 | 27.09 | -25.56 |
| ඉලෙක්ට්‍රොනික සහ ඉලෙක්ට්‍රොනික සංරචක | 269.63 | 296.58 | 10.00 | 41.25 | 40.82 | -1.04 |
| කුළුබඩු සහ සාන්ද්‍රිත නිෂ්පාදන | 194.26 | 216.73 | 11.57 | 33.91 | 37.53 | 10.68 |
| සැකසූ ආහාර පාන වර්ග | 248.01 | 245.69 | -0.94 | 37.85 | 36.21 | -4.33 |
| මුහුදු ආහාර | 162.82 | 149.63 | -8.10 | 20.65 | 17.25 | -16.46 |
| විසිතුරු මසුන් | 11.52 | 14.89 | 29.25 | 1.36 | 1.80 | 32.35 |
| එළවළු | 15.12 | 16.82 | 11.24 | 1.90 | 2.08 | 9.47 |
| පළතුරු | 19.93 | 25.21 | 26.49 | 3.23 | 3.63 | 12.38 |
| වෙනත් අපනයන බෝග | 51.48 | 50.29 | -2.31 | 8.46 | 12.32 | 45.63 |
| මල් සහ ශාක පත්‍ර | 8.56 | 8.93 | 4.32 | 0.83 | 1.04 | 25.30 |
| බෝට්ටු නිෂ්පාදන | 5.88 | 12.72 | 116.33 | 0.33 | 0.11 | -66.67 |
| ඛනිජ තෙල් නිෂ්පාදන | 85.25 | 244.03 | 186.25 | 4.04 | 54.25 | 1242.82 |
| වෙනත් | 1102.35 | 824.68 | -25.19 | 150.44 | 107.78 | -28.36 |
| **මුළු වෙළඳ භාණ්ඩ අපනයනය** | **7,686.75** | **6,898.34** | **-10.26** | **1,164.60** | **1,027.24** | **-11.79** |

(මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහබැංකුව, ශ්‍රී ලංකා රේගුව)

**වගුව 2: ඉහළම අපනයන ගමනාන්ත 15 හි වෙළඳ භාණ්ඩ අපනයන කාර්ය සාධනය සංසන්දනය කිරීම (ඇ.ඩො.මි)**

| | රට | ජන-ජූලි 2022 | ජන-ජූලි 2023 | % වර්ධනය (22-23) | ජූලි 2022 | ජූලි 2023 | % වර්ධනය (22-23) |
|---|---|---|---|---|---|---|---|
| 1 | එක්සත් ජනපදය | 1,988.43 | 1,620.57 | -18.50 | 300.71 | 253.79 | -15.60 |
| 2 | එක්සත් රාජධානිය | 602.01 | 498.25 | -17.24 | 95.11 | 73.42 | -22.81 |
| 3 | ඉන්දියාව | 500.75 | 493.87 | -1.37 | 63.01 | 81.28 | 29.00 |
| 4 | ජර්මනිය | 450.51 | 349.90 | -22.33 | 66.57 | 50.46 | -24.20 |
| 5 | ඉතාලිය | 359.21 | 381.23 | 6.13 | 63.88 | 59.02 | -7.61 |
| 6 | නෙදර්ලන්තය | 233.88 | 197.11 | -15.72 | 30.86 | 27.55 | -10.73 |
| 7 | කැනඩාව | 214.00 | 179.74 | -16.01 | 33.79 | 25.37 | -24.92 |
| 8 | එක්සත් අරාබි එමීර් රාජ්‍යය | 161.57 | 221.57 | 37.14 | 26.35 | 37.88 | 43.76 |
| 9 | බෙල්ජියම | 186.35 | 132.51 | -28.89 | 29.96 | 20.89 | -30.27 |
| 10 | ප්‍රංශය | 153.79 | 152.25 | -1.00 | 22.91 | 25.03 | 9.25 |
| 11 | ඕස්ට්‍රේලියාව | 143.17 | 130.61 | -8.77 | 23.21 | 17.09 | -26.37 |
| 12 | චීනය | 140.98 | 141.70 | 0.51 | 21.49 | 19.22 | -10.56 |
| 13 | ජපානය | 121.21 | 114.90 | -5.21 | 20.03 | 13.97 | -30.25 |
| 14 | බංග්ලාදේශය | 129.33 | 110.73 | -14.38 | 15.52 | 11.79 | -24.03 |
| 15 | මෙක්සිකෝව | 99.30 | 100.54 | 1.25 | 17.11 | 14.76 | -13.73 |
| | වෙනත් වෙළඳපොළ | 2,202.26 | 2,072.86 | -5.88 | 334.09 | 295.72 | -11.48 |
| | **එකතුව** | **7,686.75** | **6,898.34** | **-10.26** | **1,164.60** | **1,027.24** | **-11.79** |

(මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහබැංකුව, ශ්‍රී ලංකා රේගුව)

**වගුව 3: කලාපය අනුව වෙළඳ භාණ්ඩ අපනයන කාර්ය සාධනය සංසන්දනය කිරීම (ඇ.ඩො.මි)**

| රට | ජන-ජූලි 2022 | ජන-ජූලි 2023 | % වර්ධනය (22-23) | ජූලි 2022 | ජූලි 2023 | % වර්ධනය (22-23) |
|---|---|---|---|---|---|---|
| එක්සත් ජනපදය | 1,988.43 | 1,620.57 | -18.50 | 300.71 | 253.79 | -15.60 |
| යුරෝපා සංගමය (EU) එක්සත් රාජධානිය හැර | 1,769.01 | 1,542.68 | -12.79 | 274.96 | 230.47 | -16.18 |
| දකුණු ආසියාව | 737.75 | 709.05 | -3.89 | 91.99 | 108.45 | 17.89 |
| අග්නිදිග ආසියානු ජාතීන්ගේ සංගමය (ASEAN) | 525.47 | 597.08 | 13.63 | 94.95 | 95.29 | 0.36 |
| පොදු රාජ්‍ය මණ්ඩලීය රටවල් | 184.39 | 190.43 | 3.28 | 20.92 | 27.91 | 33.41 |
| අප්‍රිකානු රටවල් | 169.58 | 184.66 | 8.89 | 25.69 | 29.88 | 16.31 |
| මැද පෙරදිග රටවල් (සයිප්‍රසය සහ ඊජිප්තුව හැර) | 123.18 | 146.15 | 18.65 | 23.95 | 20.36 | -14.99 |
| වෙනත් | 2,188.94 | 1,907.72 | -12.85 | 331.43 | 261.09 | -21.22 |
| **මුළු වෙළඳ භාණ්ඩ අපනයනය** | **7,686.75** | **6,898.34** | **-10.26** | **1,164.60** | **1,027.24** | **-11.79** |

(මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහබැංකුව, ශ්‍රී ලංකා රේගුව)

# අපනයන පුවත්

මාසික තොරතුරු ප්‍රකාශනය

01 වෙළුම 03 කලාපය
2023 අගෝස්තු/සැප්තැම්බර්

ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය
අංක 42 නවම් මාවත
කොළඹ 02
ශ්‍රී ලංකාව

**දුරකථන** : +94-11-230-0705 / 11
**ෆැක්ස්** : +94-11-230-0715

**ඊ-මේල්** : edb@edb.gov.lk
**වෙබ්** : www.srilankabusiness.com